පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

කුරුණෑගල දිස්ත්‍රික්කය

--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 15 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 09 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3.2, 1.3.6, 1.3.7 ඡේදයන්හි දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැති ශේෂය රු.28,018,693 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.24,861,001 ක් ලෙස රු.3,157,692 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(ආ). භෞතික සැලසුම් මංමාවත්, ඉඩම් හා ගොඩනැගිලි වැඩසටහනෙහි කර්මාන්ත ආධාර ලෙස දක්වා තිබූ රු.50,644,722 ක වටිනාකම තුල පොදු පරිපාලනය වැඩසටහන යටතේ ගිණුම් ගතකල යුතු කැබ් රථයකට ලැබූ ප්‍රදාන රු.4,187,200 ක්ද ඇතුලත්ව තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත ආධාර රු.32,204,419 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.46,457,522 ක් ලෙස රු.14,253,103 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත වියදම රු.36,316,804 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.52,690,325 ක් ලෙස රු.16,373,521 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඉ). කුට්ටිගල් ව්‍යාපෘතියේ ආදායම වූ රු.3,368,060 ක වටිනාකම භෞතික සැලසුම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි වැඩසටහනෙහි 3/62 පුනරාවර්තන අය ශීර්ෂයට ගිණුම් ගතකර ඊට අදාල වියදම වූ රු.4,695,567 ක් 309 ප්‍රාග්ධන වැය ගිණුමට බැර කිරීමෙන් 309 ප්‍රාග්ධන වැය ගිණුමේ වියදම හා කුට්ටිගල් ව්‍යාපෘති වියදම එකී ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගතව තිබුණි.

(ඊ). සමාලෝචිත වර්ෂය තුල පොදු සැපයුම් ණයහිමි ගිණුමට හරකර තිබූ රු.10,013,747 තුල කර්මාන්ත ණයහිමි ගිණුමට හර විය යුතු රු.7,249,891 ක්ද ඇතුලත්ව තිබුණි.

(උ). සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමි ශේෂය රු.30,471,483 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.32,053,107 ක් ලෙස රු.1,581,624 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඌ). සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොලිය රු.3,133,050 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.5,983,541 ක් ලෙස රු.2,850,491 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(එ). සමාලෝචිත වර්ෂය තුල ඉඩම් කට්ටි සැලසුම් අනුමත කිරීමේදී "හතලිස්පහුව බූවෙලේහේන" නමැති ඉඩමෙන් සභාවට ලැබී තිබූ රු.3,485,000 ක් වටිනා පර්චස් 41 ක් වූ වත්කම ගිණුම්ගත නොවීමෙන් වර්ෂ අවසානයට ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගතව තිබුණි.

(ඒ). සමාලෝචිත වර්ෂය අවසානයට මෝටර් රථ හා කරත්ත වටිනාකම රු.17,159,568 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.18,436,118 ක් ලෙස රු.1,276,550 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඔ). සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.1,148,501 ක් වූ ලීබඩු ප්‍රාග්ධනිත කිරීමේදී ලීබඩු ගිණුම 'හර' කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම් ගිණුම 'බැර' කිරීම වෙනුවට ජ'නල් සටහන් අංක 25 මගින් ලීබඩු සවිකිරීම් ගිණුම හර කර පොදු පරිපාලන වැඩසටහනෙහි 103 වැය විෂයයට බැර කිරීමෙන් එකී වැඩසටහනෙහි හා ප්‍රාග්ධන යෙදුමින් ආදායමට දායකවීමේ ගිණුම් ශේෂය රු.1,148,501 කින් අඩුවෙන් ගිණුම් ගතව තිබුණි.

(ඕ). සමාලෝචිත වර්ෂය තුල වීරඹුගෙදර උපකාර්යාලයේ ළමා උද්‍යානය අළුත්වැඩියාව වෙනුවෙන් දැරූ රු.1,485,974 ක් හා ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල සඳහා වැය කරන රු. 10,100,455 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ක). සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු මුද්දර ගාස්තු ශේෂය රු.25,986 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.646,320 ක හර ශේෂයක් ලෙස ගෙන තිබුණි.

(ග). සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු එකතු කල අගය මත බදු රු.70,725 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවලට එය රු.26,028 ක් ලෙස රු.44,697 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(ච). සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු.29,581,274 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.28,616,403 ක් ලෙස රු.964,871 ක් අඩුවෙන් ගෙන තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.1,665,789 ක් ද ගිණුම් ගතකර නොතිබුණි.

(ජ). සමාලෝචිත වර්ෂයට අදාලව වරිපනම් හා බදු ආදායම වූ රු.6,649,817 තුල ඉඩම් විකුණුම් බදු රු.1,285,182 ක් හා කර්මාන්ත බදු රු.776,832 ක් ඇතුලත්ව තිබුණි.

(ට). සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු.18,430,029 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.52,778,955 ක් ලෙස රු.34,348,926 ක් වැඩියෙන් ගෙන තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය

අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය රු.18,430,029 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.15,000,000 ක් ලෙස රු.3,430,029 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(ඩ). සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු.2,556,876 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.2,949,814 ක් ලෙස රු.392,938 ක් වැඩියෙන් ගෙන තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.815,167 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු.284,416 ක් ලෙස රු.530,751 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(න). සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු ශේෂය රු. 28,635,788 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට එය රු. 27,435,788 ක් ලෙස රු. 1,200,000 ක් අඩුවෙන් ගෙන තිබුණි.

1.3.2 <u>අවිනිශ්චිත ගිණුම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් මාරු ලෙස ජංගම වත්කම්වල මුදල් ශේෂයට එකතු කරතිබූ රු.8,032,660 ක අවිනිශ්චිත ස්වභාවයේ හර ශේෂයක් පැවතුණි.

1.3.3 <u>අසම්භාව්‍ය බැරකම්</u>

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති, පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම මත සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගෙවිය යුතු ශේෂය රු.8,003,966 ක්ව තිබුණි.

1.3.4 <u>නොසැසදූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට දක්වා තිබූ ශේෂ යටතේ ගිණුම් විෂයයන් 15 ක ගිණුම අනුව හා අදාල ලේඛන අනුව අනුරූපී අගයන් අතර රු. 42,603,703 ක නොසැසඳීම් පැවතුණි.

1.3.5 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.53,008,886 ක් වූ අතර, එයින් රු. 49,912,499 කට අදාල කාල විශ්ලේෂණය ඉදිරිපත් නොවුණි.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.53,877,213 ක් වූ අතර, එයින් රු.1,990,610 ක්ම වසර 3 ට වැඩි කාලයකට අදාල විය.

1.3.6 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 21,757,567 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

1.3.7 <u>අධිකාරි බලය නොලත් ගනුදෙනු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). පැනනැගි ආකාරය, වටිනාකම, සැදුම්ලත් ආකාරය යනාදිය හඳුනාගැනීමකින් තොරව හා අනුමැතියකින් තොරව ඉකුත් වර්ෂ හිඟ හිටි වෙනත් කර්මාන්ත ණයගැති රු.2,344,092 ක අගයන් ජ'නල් සටහන් අංක 5 මගින් සමුච්චිත අරමුදල් ගිණුමට හර කර කපාහැර තිබුණි.

(ආ). පොදු (ජංගම) බැංකු ගිණුමට අදාලව 2012 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව රු.1,075,666 ක අයිරා ශේෂයක් පැවතියද, 2013 ජනවාරි 01 දිනට එම අගය රු.2,063,370 හර ශේෂයක් ලෙස මුදල් පොතට ගෙන තිබුණි. එමෙන්ම 2012 දෙසැම්බර් බැංකු සැසඳුමේදී රු.7,037,247 ක හඳුනා නොගත් ගෙවීම් ලෙස ගැලපුමක් පැවති අතර 2013 ජනවාරි බැංකු සැසඳුමෙහි එකී ගැලපුම ඉවත් කර තිබුණි. එම වෙනස්කම් කිරීමට වූ හේතුව හෝ අදාල අනුමැතියක් ඉදිරිපත් නොකෙරුණි.

02 <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.48,748,066 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.8,367,024 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.57,115,090 ක වර්ධනයක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.51,132,341 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.68,250,146 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.31,630,261 ක් දක්වා අඩුවී තිබුණි.

2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.115,246,362 කින් සියයට 83 ක් වූ රු.95,819,356 ක් උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.51,132,341 කින් සියයට 63 ක් වූ රු.32,204,419 ක් ගමනැගුම, මගනැගුම, වයඹ පුබුදුව වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.66,498,297 න් සියයට 72 ක් ලෙස රු.47,754,183 ක් පඩිනඩි වියදම වූ අතර ඉන් සියයට 60 ක් ලෙස රු.28,616,403 ක් වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.68,250,146 න් සියයට 6 ක් ලෙස රු.4,112,385 ක් පමණක් සභා අරමුදල් වැය වී තිබූ අතර ඉතිරි සියයට 94 ක් වූ රු.64,137,761 ක මුදල වෙනත් ආයතනවල ප්‍රතිපාදනවලින් ඉටුකල සංවර්ධන කාර්යයන් සඳහා වැය වූ මුදල් විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, කඩකුලී, බදුකුලී වැනි ආදායම් ක්ෂේත්‍රයේදි එකතු කිරිම සඳහා නිශ්චිත බලයක් නොතිබුණ ද, සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම වරිපනම් හා වෙළඳ බලපත්‍ර වැනි ආදායම් ද ක්ෂේත්‍රයේදි එකතු කර තිබුණි.

2.3.2 වරිපනම් හා බදු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල බල ප්‍රදේශයට අදාලව ඒකක 3360 යටතේ වාර්ෂිකව රු.1,762,334 ක් බිල්කර තිබුණු අතර එයින් සමාලෝචිත වර්ෂය ආරම්භයට ඒකක 1195 කට අදාලව රු.1,383,408 ක් වරිපනම් බදු හිඟයක් පැවතුණි. එයින් හිඟ ලැයිස්තු පිළියෙල කර තිබුණේ ඒකක 41 ක් සඳහා වූ රු.147,330 ක් වෙනුවෙන් පමණි.

(ආ). පොතුහැර උප කාර්යාල බල ප්‍රදේශයට අදාල වරිපනම් ඒකක 1900 යටතේ වාර්ෂිකව රු.1,094,568 ක් බිල් කර තිබුණු අතර එම බිල් කිරීම් මත සියයට 127 ලෙස රු.1,437,698 ක හිඟ ශේෂයක්ද, වීරඹුගෙදර උප කාර්යාල බල ප්‍රදේශයට අදාල වරිපනම් ඒකක 454 ක් යටතේ රු.308,130 ක හිඟ ශේෂයක්ද, හතලිස්පහුව උපකාර්යාලයට අදාලව රු.2,183,085 ක හිඟ ශේෂයක්ද සමාලෝචිත වර්ෂය අවසානයට පැවතිණි.

2.3.3 බදු කුලී

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). වාර්ෂික බදුදීම් යටතේ 2007-2012 කාල පරිච්ඡේදයට අදාල ගෙවීම් පැහැර හැර ඇති බදුකරුවන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අවස්ථා 18 ට අදාලව රු.1,330,314 ක හිඟයක් පැවතිණි.

(ආ). පොතුහැර උපකාර්යාල බල ප්‍රදේශයට අයත් වත්කම් බදු දීම් යටතේ 2011 වර්ෂයේ සිට පැවත එන රු.28,149 ක හා අවස්ථා 12 කට අදාලව 1998 වර්ෂයේ සිට පැවත එන රු.184,596 ක හිඟ ශේෂයක් පැවතුණි.

2.3.4 ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 59 සිට 67 දක්වා වූ රීති ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පැවැත්විය යුතු අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) හා 152(1) වගන්ති ප්‍රකාරව, කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳව ලැයිස්තුවක් පිළියෙල කර ලේකම්වරයා

වෙත ඉදිරිපත් කළ යුතු විය. එසේම සභාව විසින් පනවන ලද බද්ද දින 7 ක් ඇතුලත ගෙවන ලෙස ප්‍රා.ස. 26 ආකෘතිය මඟින් අදාල පාර්ශවයන්ට දැනුම් දිය යුතු වුවද, සභාව විසින් එසේ කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධන ඇගයීම

සභා බල ප්‍රදේශය තුල වීථි පහන් 7,192 ක් පමණ සවිකර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුල එකී වීථි පහන් නඩත්තුව සඳහා උපකරණ වැය වශයෙන් රු.322,307 ක් දරා තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව විසින් 2009 වර්ෂයේ - 2012 වර්ෂය දක්වා කාලය තුළ අනුමත කල ගොඩනැගිලි අයදුම්පත් 853 න් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අනුකූලතා සහතික ලබා නොගත් ස්ථාන 793 ක් විය. එම ගොඩනැගිලි ඉදිකිරීම් නිමව තිබුණේ නම් සභා අතුරු ව්‍යවස්ථා අනුව රු.222,040 ක ගොඩනැගිලි අනුකූලතා සහතික පත් ආදායමක්ද අදාල ගොඩනැගිලි ඉදිකිරීම අවසන්ව නොමැති නම් බලපත්‍ර කාලය දීර්ඝ කරවා ගැනීමේ ගාස්තු මත වූ ආදායමක්ද අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ). වත්කම් බදුදීමට අදාලව අවස්ථා 3 ක් යටතේ වන රු.246,335 ක හිඟ මුදල් අයකර ගැනීම සඳහා නඩු පවරා ඇති බව ආදායම් ලේඛනවල සඳහන් වුවද, එකී නඩු ගොනුවල නඩු වාර්තා පිටපත් හෝ අදාල නඩුවල ප්‍රගතිය දක්වා නොතිබුණි. එමෙන්ම අවස්ථා 4 කට අදාල රු.469,138 ක් සම්බන්ධ නඩු පැවරීමට කටයුතු කර ඇති බව ආදායම් ලේඛනයේ දක්වා තිබුණද එකී නඩු පැවරූ බවක් හඳුනාගත නොහැකි විය. එමෙන්ම අවස්ථා 11 ක් යටතේ පවතින රු.614,841 ක හිඟ මුදල් සම්බන්ධව අයකිරීමට ගෙන ඇති ක්‍රියා මාර්ගද හඳුනාගත නොහැකි විය.

(ඇ). බස්නැවතුම්පල ආපන ශාලාව සම්බන්ධයෙන් පැවති නඩුවේදී කුරුණෑගල මහාධිකරණය විසින් පැමිණිලි පාර්ශවය වූ බදුකරුට වාසිදායක ලෙස 2011 වර්ෂයේදී ලබාදී තිබූ තීන්දුවට එරෙහිව සභාව 2012 වර්ෂයේදී අභියාචනාධිකරණයේ අභියාචනයක් ගොනුකර තිබුණද, එකී අභියාචනයේ ප්‍රගතිය පිළිබඳව සභාව විසින් පසු විපරමක් කර නොතිබුණි. එහෙත් සභාව විසින් මසකට රු.7,000 බැගින් බිල්කරමින් පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.638,597 ක හිඟයක් විය.

(ඈ). ගොඩවෙල සතිපොල ආපන ශාලාව බදු දීම සඳහා 2008 වර්ෂයේ සිට ගිවිසුමකට එළඹී නොතිබුණද අදාල පාර්ශවය විසින් ආපන ශාලාව පවත්වාගෙන ගොස් තිබූ අතර බිල් කිරීමක් හෝ කුලී ගෙවීමක් හෝ සිදු කර නොතිබුණි. එමෙන්ම 2008 වර්ෂයට අදාලව පැවති රු.9,920 ක හිඟ කුලියක්ද නිරවුල් වී නොතිබුණි. 2013 ජනවාරි 29 දින පැවති නඩු විභාගයේ පැමිණිලි පාර්ශවය වූ සභාවේ ඉල්ලීමට අනුව තක්සේරු ගාස්තුවකට යටත්ව නඩුව නිෂ්ප්‍රභා කර තිබුණි. සභාව විසින් 2013 මැයි සිට රු.2,000 ක මාසික කුලියට අදාල බදුකරු සමඟ නව ගිවිසුමකට එළඹ තිබුණු අතර 2008 වර්ෂය දක්වා පැවති

රු.9,920 ක හිඟ මුදල්ද අයකරගෙන තිබුණි. එහෙත් 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා විභාග වූ නඩුව සභාව ඉල්ලා අස්කර ගැනීම හේතුවෙන් එකී නඩුව වෙනුවෙන් දැරූ නීතිඥ ගාස්තුව ඵල රහිත වියදමක් වී තිබුණු අතර 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අයකර ගැනීමට තිබූ රු.60,000 ක කුලී ආදායමක්ද සභාවට අහිමි වී තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂය තුල සභා කාර්යාලය ඉදිකිරීම් වෙනුවෙන් අදාල කොන්ත්‍රාත්කරුට ගෙවූ රු.1,948,036 ක එකතු කළ අගය මත බදු වටිනාකම සභාව විසින් ගෙවිය යුතු එකතු කල අගය මත බදු ගණනය කිරීමේදී ඉඩදිය හැකි අඩුකිරීම් යටතේ අඩුකර ගෙන නොතිබුණි.

3.3 <u>වත්කම් කළමනාකරණය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සභාව සතු දේපල හඳුනාගෙන නීත්‍යානුකූලව අයිතිය පවරා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් “ඔරුලියද්ද ඉඩමෙහි” අනවසර නිවෙස් කිහිපයක් හා මුස්ලිම් පල්ලියක් ඉදිකර තිබුණු අතර, “පොතුහැර කුරිපොත්ත වික්ටර් රේන්ජ්” වෙන්දේසි ඉඩමෙන් පොදු කටයුතු සඳහා වෙන්කල කොටසෙහි අනවසර පුද්ගලයකු පදිංචි වී තිබුණි.

(ආ). ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂගේ 2003 ජූනි 03 දිනැති ලිපිය මගින් අක්කර 3 ක් පමණ වන වීරඹුගෙදර පොළ භූමිය සභාවට පැවරීමට නිර්දේශ කර තිබුණද, සභාව විසින් ඒ පිළිබඳව අදාල කටයුතු ඉටු නොකිරීම හේතුවෙන් 2012 වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම විසින් එම ඉඩම ඔප්පුවක් මගින් පෞද්ගලික පාර්ශවයක් වෙත පවරා දී තිබුණි. තවද සභාවට එම දේපල අහිමිවීම හේතුවෙන් සභා දේපලක් සේ සලකා පවත්වාගෙන ගොස් තිබූ සතිපොළ පවත්වාගෙන යාම පිළිබඳව ගැටළුකාරී තත්ත්වයන් උද්ගත වී තිබුණු අතර සභාවේ අවසන් ගිණුම්වලද මෙකී ඉඩම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ). මුළු පිරිවැය රු.597,879 ක් වූ සෝගාතකාගාරය ඉදිකිරීමේදී මහජන සෞඛ්‍ය පරික්ෂකගේ උපදෙස් ලබා නොගැනීම හේතුවෙන් අදාල ගොඩනැගිල්ල සෝගාතකාගාරයක් ලෙස ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි.

04. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය
(ආ). අයවැය පාලනය
(ඇ). ආදායම් පරිපාලනය
(ඈ). වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය